සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

(නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus)

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

ශ්‍රී ලංකා ඉතිහාසය I (I කොටස)
இலங்கை வரலாறு I (பகுதி I)
History of Sri Lanka I (Part I)

25 S I

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**ශ්‍රී ලංකා ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1978 දක්වා**

විභාග අංකය: ....................................

**උපදෙස්:**

* මෙම කොටස ප්‍රශ්න **40** කින් සමන්විත වේ. **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
* එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර **පහ** බැගින් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ **එකක්** පමණි. එම නිවැරදි පිළිතුර තෝරා, දී ඇති **උපදෙස් පරිදි ලකුණු කරන්න.**
* **මෙම කොටසට ලකුණු 40 ක් දෙනු ලැබේ.**
* කොටස් **දෙකට ම** මුළු කාලය **පැය තුනකි**. පිළිතුරු ලියා අවසන් වූ පසු, **I කොටස**, **II කොටසේ** පිළිතුරු පත්‍ර සමඟ **අමුණා භාර දෙන්න.**

## I කොටස

● අංක **1** සිට **10** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් **පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ **නො ගැළපේ**. එම **නො ගැළපෙන** නම කුමක් දැ'යි හඳුනාගෙන එහි **අංකය වරහන තුළ** ලියන්න.

1. (1) බටදොඹ ලෙන (2) පිදුරංගල (3) බෙලිලෙන
(4) පාහියන් ලෙන (5) වටවල (.........)

2. (1) බෝධිවංස (2) දළදාවංස (3) දීපවංස
(4) ථූපවංස (5) ධාතුවංස (.........)

3. (1) කොරතොට (2) ගෝකණ්ණ (3) මහාතිත්ථ
(4) ඌරාතොට (5) ජම්බුකෝල පට්ටන (.........)

4. (1) මෙගස්තිනිස් (2) චෙංහෝ (3) කොස්මස්
(4) ප්ලිනි (5) ඔනෙසික්‍රිටස් (.........)

5. (1) හැටදාගේ (2) රංගිරි දඹුල්ල (3) රන්කොත් වෙහෙර
(4) දීඝවාපි (5) නිශ්ශංක ලතා මණ්ඩපය (.........)

6. (1) සෙම්බග පෙරුමාල් (2) වරෝදය (3) කුලශේඛර
(4) මාර්තණ්ඩ (5) කුණහුෂණ (.........)

7. (1) විජයබා පිරිවෙන (2) පද්මාවතී පිරිවෙන (3) මයුරපාද පිරිවෙන
(4) ආලාහන පිරිවෙන (5) සුනේත්‍රාදේවි පිරිවෙන (.........)

[දෙවැනි පිටුව බලන්න.

**8.** (1) රෝම ලන්දේසි නීතිය (2) රාද් වැන් ජස්ටිටී (3) ශ්‍රේෂ්ඨාධිකරණය
(4) ලැන්ඩ් රාද් (5) දිස්ත්‍රික් උසාවි (.........)

**9.** (1) දන්තුරේ සටන (2) බලන සටන (3) කටුවන සටන
(4) රන්දෙනිවෙල සටන (5) ගන්නොරුව සටන (.........)

**10.** (1) එමර්සන් ටෙනන්ට් (2) ජෝන් ඩොයිලි (3) ජෝර්ජ් ටර්නර්
(4) ලෙනාර්ඩ් වුල්ෆ් (5) ජෝර්ජ් බර්ඩ් (.........)

● අංක **11** සිට **15** තෙක් ප්‍රශ්නවල **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට **නො ගැළපේ.** එම **නො ගැළපෙන** යුගලය කුමක්දැ'යි හඳුනාගෙන ඊට අදාළ **අංකය,** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**11.**
(1) හෝපිටිගමු සෙල්ලිපිය - වෙළෙඳ නගරයක පරිපාලනය පිළිබඳව
(2) වේලයික්කාර සෙල්ලිපිය - දළදා වහන්සේගේ ආරක්ෂාව පිළිබඳව
(3) අඹගමුව සෙල්ලිපිය - අධිකරණ පරිපාලනය පිළිබඳව
(4) දෙවනගල සෙල්ලිපිය - ඉඩම් ප්‍රදානයක් පිළිබඳව
(5) තෝනිගල සෙල්ලිපිය - ධාන්‍ය තැන්පතු ක්‍රමය පිළිබඳව (.........)

**12.**
(1) විජය - තම්බපණ්ණි
(2) පණ්ඩුවාසදේව - කල්‍යාණි
(3) භද්දකච්චානා - ගෝකණ්ණ
(4) සංඝමිත්තා තෙරණිය - ජම්බුකෝළ පට්ටන
(5) හේමමාලා සහ දන්ත - ලංකා පට්ටන (.........)

**13.**
(1) පූජාවලිය - දළදා වහන්සේට පුදපූජා පැවැත්වීම පිළිබඳ ග්‍රන්ථයකි.
(2) සමන්තපාසාදිකා - විනය පිටකයට ලියන ලද අටුවා ග්‍රන්ථයකි.
(3) උත්තර විහාරට්ඨ කථා - අභයගිරි විහාර භික්ෂූන් විසින් ලියන ලද කෘතියකි.
(4) සද්ධර්මරත්නාවලිය - දඹදෙණි යුගයේ දී රචිත ගද්‍ය ග්‍රන්ථයකි.
(5) යාල්පාන වෛපවමාලෙයි - යාපන ප්‍රදේශයේ ඉතිහාසය ඇතුළත් ග්‍රන්ථයකි. (.........)

**14.**
(1) විලියම් ග්‍රෙගරි - ජාතික කෞතුකාගාරය පිහිටුවීම
(2) තෝමස් මේට්ලන්ඩ් - ශ්‍රේෂ්ඨාධිකරණය පිහිටුවීම
(3) එඩ්වර්ඩ් බාන්ස් - ගන්නොරුවේ කෝපි වත්තක් ආරම්භ කිරීම
(4) ටොරිංටන් - මාර්ග බද්ද පැනවීම
(5) හර්කියුලීස් රොබින්සන් - ගම්සභා ක්‍රමය යළි ස්ථාපිත කිරීම (.........)

**15.**
(1) ඒ.ඊ. ගුණසිංහ - කම්කරු පක්ෂය
(2) ඇන්.ඇම්. පෙරේරා - ලංකා සම සමාජ පක්ෂය
(3) පොන්නම්බලම් අරුණාචලම් - ලංකා ජාතික සංගමය
(4) ජී.ජී. පොන්නම්බලම් - සමස්ත ලංකා ද්‍රවිඩ සංගමය
(5) සිරිමා බණ්ඩාරනායක - ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (.........)

● අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් **X** සහ **Y** තීරවල දී ඇත. **Y** තීරයේ දී ඇති නාම / ප්‍රකාශන / දින වකවානු **X** තීරයේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට **නො වේ. Y** තීරය, **X** තීරය සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත දී ඇති සංයෝග පහෙන් **එකක්** නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් **අංකය** තෝරා **වරහන තුළ** ලියන්න.

**16.**

| X | Y |
|---|---|
| (i) ගෝණ නදී | A මල්වතු ඔය |
| (ii) කදම්බ නදී | B මහවැලි ගඟ |
| (iii) ජජ්ජර නදී | C කලා ඔය |
| (iv) කප්පකන්දර නදී | D මැණික් ගඟ |
| (v) මහාවාලුකා නදී | E දැදුරු ඔය |

(1) AEDBC (2) BACED (3) CAEDB (4) DBCAE (5) EDBCA (.........)

**17.**

| X | Y |
|---|---|
| (i) කෝකිල සංදේශය | A අලගියවන්න මුකවෙටි |
| (ii) ගුත්තිල කාව්‍යය | B ඉරුගල්කුලතිලක හිමි |
| (iii) සුභාෂිතය | C වෑත්තෑවේ හිමි |
| (iv) ලෝවැඩ සඟරාව | D තොටගමුවේ ශ්‍රී රාහුල හිමි |
| (v) සැලළිහිණි සංදේශය | E වීදාගම මෛත්‍රීය හිමි |

(1) AEDBC (2) BCAED (3) CAEDB (4) DEBCA (5) EDBCA (………)

**18.**

| X | Y |
|---|---|
| (i) පළමුවෙනි පරාක්‍රමබාහු රජතුමා | A කෝට්ටේ |
| (ii) දෙවෙනි පරාක්‍රමබාහු රජතුමා | B ගම්පොළ |
| (iii) හතරවෙනි පරාක්‍රමබාහු රජතුමා | C කුරුණෑගල |
| (iv) පස්වෙනි පරාක්‍රමබාහු රජතුමා | D දඹදෙණිය |
| (v) හයවෙනි පරාක්‍රමබාහු රජතුමා | E පොළොන්නරුව |

(1) ABECD (2) BCDAE (3) CABED (4) CDABE (5) EDCBA (………)

**19.**

| X | Y |
|---|---|
| (i) සපුමල් කුමාරයා | A ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා |
| (ii) ටිකිරි බණ්ඩාර | B දෙවන රාජසිංහ රජතුමා |
| (iii) කොනප්පු බණ්ඩාර | C හයවන බුවනෙකබාහු රජතුමා |
| (iv) මහා අස්ථාන | D පළමුවන විමලධර්මසූරිය රජතුමා |
| (v) කන්නසාමි | E පළමුවන රාජසිංහ රජතුමා |

(1) ABDCE (2) CADBE (3) CBADE (4) CEDBA (5) ECDBA (………)

**20.**

| X | Y |
|---|---|
| (i) කින්නර බද්ද | A අලිඇතුන් පිළිබඳ කාර්යාංශය |
| (ii) කුරුවේ බද්ද | B ප්‍රවාහන කාර්යාංශය |
| (iii) මඩිගේ බද්ද | C ශිල්පීන් පිළිබඳ කාර්යාංශය |
| (iv) බඩහැල බද්ද | D විවීමේ කාර්යාංශය |
| (v) කොට්ටල් බද්ද | E කුඹල් කාර්යාංශය |

(1) ABDCE (2) BCDAE (3) DABEC (4) DBACE (5) EABDC (………)

- අංක **21** සිට **25** තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් **එකක් අදාළ මාතෘකාවට නො ගැළපේ.** එය තෝරා, ඊට අදාළ **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**21. වට්ටගාමණී අභය රජු මුහුණ දුන් අභියෝග**

(1) සත් ද්‍රවිඩ ආක්‍රමණය
(2) තීය බ්‍රාහ්මණයාගේ කැරැල්ල
(3) බැමිණිතියා සාය
(4) පාණ්ඩ්‍ය ආක්‍රමණය
(5) කපිසීසගේ මරණින් පසුව සෙන්පතියන් වට්ටගාමණී අභය හැරයාම (………)

**22. අනුරාධපුර යුගයේ රාජ්‍ය ආදායම**

(1) ඉඩම් බද්ද ප්‍රධාන ආදායම් මාර්ගය විය.
(2) මජ්ජිබෙකපත, මත්ස්‍ය භාගයෙන් අයකළ බද්ද ලෙස සැලකේ.
(3) වරාය බදු අයකළ බව ගොඩවාය සෙල්ලිපියේ සඳහන් වේ.
(4) රජු භූමියෙහි අධිපතියා ලෙස සලකන ලද බැවින් ඔහුට ඉඩම් බද්ද අය කළ හැකි විය.
(5) මරාල බද්ද අනුරාධපුර යුගයෙහි සිටි පාලකයින්ගේ ආදායම් මාර්ගයක් විය. (………)

**23. ගම්පොළ රාජධානි සමය**

(1) තුන්වැනි විජයබාහු රජු ගම්පොළ පළමුවැනි පාලකයා විය.
(2) ගම්පොළ සමයේ දී නිශ්ශංක අලගක්කෝනාර කෝට්ටේ බලකොටුව ඉදිකර විය.
(3) සේනාලංකාධිකාර ගම්පොළ සමයෙහි සිටි බලවත් ප්‍රභු පවුලකි.
(4) තිසර සංදේශය ගම්පොළ සමයෙහි දී රචනා කරන ලද කෘතියකි.
(5) ගඩලාදෙණි විහාරය ගම්පොළ සමයෙහි දී ඉදිකරන ලදී. (.........)

**24. බ්‍රිතාන්‍ය පාලන සමයේ වතු වගාව**

(1) කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණ වතු ආර්ථිකයට මඟ පෑදුවේ ය.
(2) 1880 වර්ෂය වන තෙක් කෝපි වැදගත්ම වාණිජ භෝගය විය.
(3) රබර් වගාව පිළිබඳ පළමුවෙනි අත්හදා බැලීම හෙනරත්ගොඩ දී සිදු කෙරිණ.
(4) රබර් වගාව අසාර්ථක වූ පසු සිංකෝනා වගාව මෙරට ජනප්‍රිය විය.
(5) වතු වගාව සඳහා අවශ්‍ය ශ්‍රමිකයන් දකුණු ඉන්දියාවෙන් ගෙන්වනු ලැබී ය. (.........)

**25. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලිකාංග**

(1) විධායක ජනාධිපති ධූරය
(2) ජාතික රාජ්‍ය සභාව
(3) සමානුපාතික නියෝජනය
(4) ජනමත විචාරණය
(5) දෝෂාභියෝගය (.........)

● අංක **26** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති **(A), (B), (C)** සහ **(D)** යන ප්‍රතිචාර හතර අතුරෙන් **එකක් හෝ කිහිපයක් හෝ** නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,
**(A)** සහ **(B)** පමණක් නිවැරදි නම් ........................................ **1** ද,
**(A)** සහ **(C)** පමණක් නිවැරදි නම් ........................................ **2** ද,
**(B)** සහ **(C)** පමණක් නිවැරදි නම් ........................................ **3** ද,
**(C)** සහ **(D)** පමණක් නිවැරදි නම් ........................................ **4** ද,
**වෙනත් ප්‍රතිචාර** සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි නම් ......... **5** ද, **වරහන තුළ** ලියන්න.

| **උපදෙස් සම්පිණ්ඩනය** | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| (A) සහ (B) පමණක් නිවැරදි ය. | (A) සහ (C) පමණක් නිවැරදි ය. | (B) සහ (C) පමණක් නිවැරදි ය. | (C) සහ (D) පමණක් නිවැරදි ය. | **වෙනත් ප්‍රතිචාර** සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි ය. |

**26. රෝහණ රාජ්‍යය පිළිබඳව පහත සඳහන් කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?**

(A) මහානාග මාගම සිට රෝහණ ප්‍රදේශය පාලනය කළේ ය.
(B) කාජරගාමයේ දශභතිකයන් පරාජය කළ ගෝඨාභය රෝහණ රාජ්‍යය පුළුල් කළේ ය.
(C) සේරු, සෝම හා ලෝණ ප්‍රදේශ ඇඳා ගැනීම හේතුකොට ගෙන රෝහණ රාජ්‍යය පරිහානියට පත්විය.
(D) දුටුගැමුණු රජුගේ පාලන සමයේදී කොත්මලේ, රෝහණ රාජධානියෙහි පාලන මධ්‍යස්ථානය විය. (.........)

**27. යාපන රාජධානියේ ඉතිහාසය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?**

(A) පට්ටිනප්පාලෙයි ග්‍රන්ථය යාපන රාජධානියේ ඉතිහාසය හැදෑරීමට ඇති ප්‍රධානතම මූලාශ්‍රයකි.
(B) පරරාජශේකරම් යාපන රාජධානියෙහි ප්‍රථම පාලකයා විය.
(C) යාපන රාජධානියෙහි පාලකයින් විසින් සීතාවක බැරැණ්ඩි කෝවිල ඉදිකරන ලදී.
(D) ඉබන් බතූතාගේ වාර්තාවට අනුව යාපන රාජධානියෙහි පාලකයා ශ්‍රී ලංකාවේ සුල්තාන්වරයා විය. (.........)

**28. වැලිවිට සරණංකර හිමියන් සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?**

(A) දෙගල්දොරු විහාරයෙහි දී මහණ උපසම්පදාව ලැබීම
(B) සිල්වත් සමාගම පිහිටුවීම
(C) සියම් උපසම්පදාව රැගෙන ඒමට මූලිකවීම
(D) අස්ගිරි පාර්ශවයේ පළමුවෙනි මහනාහිමි තනතුරට පත්වීම (.........)

**29. ඩොනමෝර් ආණ්ඩුක්‍රමය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?**

(A) රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටුවීම
(B) සර්වජන ඡන්ද බලය පිරිනැමීම
(C) රාජ්‍ය සේවා කොමිසම පිහිටුවීම
(D) කැබිනට් ක්‍රමය හඳුන්වාදීම (.........)

**30. 1915 සිංහල-මුස්ලිම් කෝලාහලය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?**

(A) ගම්පොළ වල්ලහගොඩ දේවාල පෙරහැර මීට ප්‍රධාන හේතුවක් විය.
(B) මෙම කෝලාහලය පාලනය කිරීම සඳහා ඇඳිරි නීතිය පනවනු ලැබී ය.
(C) රොබට් චාමර්ස් මෙකල බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා විය.
(D) මෙම කෝලාහලයේ ප්‍රතිඵලයක් වශයෙන් දහසකට වැඩි පිරිසක් මියගිය බව වාර්තා වේ. (.........)

● අංක **31** සිට **35** තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**31. නිශ්ශංකමල්ල රජු ආක්‍රමණය කළ දකුණු ඉන්දියානු ප්‍රදේශය කුමක් ද?**

(1) මධුරාපුර (2) අතිවීරරාම පට්ටනම් (3) සෝමේශ්වරම්
(4) මහබලිපුරම් (5) රාමේශ්වරම් (.........)

**32. යාපහුව රාජධානියේ පළමුවෙනි පාලකයා කවරෙක් ද?**

(1) දෙවෙනි පරාක්‍රමබාහු (2) තුන්වෙනි විජයබාහු
(3) තුන්වෙනි පරාක්‍රමබාහු (4) පළමුවෙනි බුවනෙකබාහු
(5) දෙවෙනි බුවනෙකබාහු (.........)

**33. ගම්පොළ සමයේ දී ඉදිකළ ලංකාතිලක විහාරයේ ප්‍රධාන ගෘහනිර්මාණ ශිල්පියා කවරෙක් ද?**

(1) ගණේශ්වරාචාර්ය (2) ස්ථපතිරායර
(3) දෙවරගම්පළ සිල්වත්තැන (4) දේවේන්ද්‍ර මූලාචාරින්
(5) නිලගම පටබැන්දා (.........)

**34. විද්‍යෝදය පිරිවෙන පිහිටුවන ලද්දේ කවරෙකු විසින් ද?**

(1) රත්මලානේ ධම්මාලෝක හිමි (2) වලානේ සිද්ධාර්ථ හිමි
(3) හික්කඩුවේ සුමංගල හිමි (4) රත්මලානේ ධර්මාරාම හිමි
(5) වැලිවිටියේ සෝරත හිමි (.........)

**35. ලංකා විශ්වවිද්‍යාලයේ පළමුවෙනි උපකුලපතිවරයා කවරෙක් ද?**

(1) අයිවර් ජෙනිංග්ස් (2) මාර්කස් ප්‍රනාන්දු (3) නිකලස් ආටිගල
(4) ජී.පී. මලලසේකර (5) ඊ.ඕ.ඊ. පෙරෙයිරා (.........)

- අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන **1, 2, 3, 4** සහ **5** යන කවර ප්‍රකාශ යුගලය දැ'යි තෝරා ඊට අදාළ **අංකය වරහන තුළ** ලියන්න.

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| **1** | නිවැරදි ය. | වැරදි ය. |
| **2** | නිවැරදි ය. | නිවැරදි ය. |
| **3** | වැරදි ය. | වැරදි ය. |
| **4** | වැරදි ය. | නිවැරදි ය. |
| **5** | නිවැරදි ය. | නිවැරදි වන අතර **පළමුවැන්න** මැනවින් පහදා දෙයි. |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය | |
|---|---|---|---|
| **36.** | ලක්දිව පළමුවෙනි සංඝභේදය ඇති වූයේ මහසෙන් රාජ්‍ය සමයෙහි දී ය. | කුපික්කල තිස්ස හිමියනට මහසෙන් රජු ජේතවන විහාරය පූජා කළේ ය. | (………) |
| **37.** | ගල්විහාර සෙල්ලිපිය පළමුවෙනි පරාක්‍රමබාහු රජු විසින් සිදු කළ සංඝ සාමග්‍රිය ගැන තොරතුරු වාර්තා කර තිබේ. | පළමුවෙනි පරාක්‍රමබාහු රජු සෙල්ලිපි වැඩිම සංඛ්‍යාවක් පිහිටුවා ඇති පාලකයා ලෙස සලකනු ලැබේ. | (………) |
| **38.** | ජේසුයිට් නිකාය ශ්‍රී ලංකාවට හඳුන්වා දෙන ලද්දේ ඉංග්‍රීසින් විසිනි. | ලන්දේසිහු ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල ඇළ මාර්ග පද්ධතියක් ඉදි කළහ. | (………) |
| **39.** | මෙරට අධ්‍යාපන කටයුතු ඉංග්‍රීසි මාධ්‍යයෙන් සිදුකළ යුතු බවට කෝල්බෲක්-කැමරන් කොමිසම විසින් යෝජනා කරන ලදී. | පරිපාලන කටයුතු සඳහා ස්වදේශිකයන් පුහුණු කිරීම පිණිස ඉංග්‍රීසි භාෂාව අධ්‍යාපන මාධ්‍යය විය යුතු බව කෝල්බෲක්-කැමරන් කොමිසමෙහි අදහස වූ බව පෙනේ. | (………) |
| **40.** | ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය ලබාගන්නා ලද්දේ 1955 වර්ෂයෙහි දී ය. | එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතාගේ ඝාතනයෙන් පසුව හිස් වූ අගමැති තනතුරට සිරිමා බණ්ඩාරනායක මැතිණිය පත්කරන ලදී. | (………) |

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

(නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus)

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

| | | |
|---|---|---|
| ශ්‍රී ලංකා ඉතිහාසය | I (II කොටස) | 25 S I |
| இலங்கை வரலாறு | I (பகுதி II) | |
| History of Sri Lanka | I (Part II) | |

**ශ්‍රී ලංකා ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1978 දක්වා**

**උපදෙස්:**

✻ **පළමුවන** ප්‍රශ්නය අනිවාර්ය වේ.

✻ **පළමුවන** ප්‍රශ්නයටත් **B** හා **C** කොටස්වලින් අවම වශයෙන් **එක** ප්‍රශ්නය බැගින් තෝරාගෙන **තවත්** ප්‍රශ්න **තුනකටත්** පිළිතුරු සපයන්න.

(**පළමුවන** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා **ශ්‍රී ලංකාවේ දළ සිතියමක්** සපයා ඇත.)

## A කොටස

**1.** ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.**

(i) මැණික් ගඟ (ii) බූන්දල (iii) කන්තරෝඩෙයි (iv) නාච්චදූව වැව

(v) පොළොන්නරුව (vi) ගම්පොළ (vii) දෙවිනුවර (viii) මන්නාරම

(ix) මීගමුව (x) කොට්ටියාරම (xi) බදුල්ල (xii) සබරගමුව පළාත

(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු **01** බැගිනි.)

## B කොටස

**2.** "මහසෙන් රාජ්‍ය සමයේ අවසානය තෙක් ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීම සඳහා භාවිත කළ හැකි ප්‍රධානතම මූලාශ්‍රය මහාවංසයයි."

(i) මහාවංසයේ කතුවරයා නම් කරන්න. (ලකුණු 01 යි)

(ii) මහාවංසය ලිවීම සඳහා පදනම් කරගනු ලැබූ මූලාශ්‍රය **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(iii) දේවානම්පියතිස්ස රජතුමා හා අශෝක අධිරාජයා අතර පැවති සම්බන්ධතා මහාවංසයේ සඳහන් වන ආකාරය සැකෙවින් දක්වන්න. (ලකුණු 04 යි)

(iv) මහසෙන් රාජ්‍ය සමයේ අවසානය තෙක් ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීම සඳහා ඇති ප්‍රධානතම මූලාශ්‍රය ලෙස මහාවංසය සැලකිය හැකි වන්නේ කෙසේදැයි පරීක්ෂා කරන්න. (ලකුණු 09 යි)

**3.** අනුරාධපුර හා පොළොන්නරු යුගවල ශ්‍රී ලංකාවේ වාරිමාර්ග ක්‍රමයේ අනුක්‍රමික වර්ධනය පහත දැක්වෙන ක්ෂේත්‍ර යටතේ විස්තර කරන්න.

(i) වැව්

(ii) ඇළ මාර්ග

(iii) වාරි තාක්ෂණය (ලකුණු 16 යි)

**4.** පහත දැක්වෙන ක්ෂේත්‍ර යටතේ පළමුවන පරාක්‍රමබාහු රජුගේ දේශපාලන කාර්ය සංසිද්ධිය අගය කරන්න.

(i) දිවයින එක්සේසත් කිරීම (ලකුණු 09 යි)

(ii) විදේශ ප්‍රතිපත්තිය (ලකුණු 07 යි)

**5.** පහත සඳහන් මතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

(i) රජරට චෝළ ආධිපත්‍යය

(ii) දෙවන පරාක්‍රමබාහු රජතුමා

(iii) ගම්පොළ අවධියේ යාපන රාජ්‍යයේ බල ව්‍යාප්තිය

(iv) කෝට්ටේ යුගයේ අධ්‍යාපනය හා සාහිත්‍යය

(එක් කෙටි සටහනකට ලකුණු **08** බැගිනි.)

## C කොටස

**6.** ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත්වල පෘතුගීසීන් හා ලන්දේසීන් විසින් අනුගමනය කරන ලද ආර්ථික ප්‍රතිපත්ති සංසන්දනාත්මකව පරීක්ෂා කරන්න. (ලකුණු 16 යි)

**7.** "1818 බ්‍රිතාන්‍ය විරෝධී නිදහස් අරගලය ශ්‍රී ලංකා ඉතිහාසයේ තීරණාත්මක අවස්ථාවක් සලකුණු කරයි."

(i) බ්‍රිතාන්‍ය විරෝධී අරගලය ආරම්භ වූ ප්‍රදේශය නම් කරන්න. (ලකුණු 01 යි)

(ii) බ්‍රිතාන්‍ය විරෝධී අරගලයේ නායකයන් **දෙදෙනකු** නම් කරන්න. (ලකුණු 02 යි)

(iii) බ්‍රිතාන්‍ය විරෝධී අරගලය ඇතිවීමට 1815 උඩරට ගිවිසුම තුඩු දුන් ආකාරය සැකෙවින් දක්වන්න. (ලකුණු 04 යි)

(iv) 1818 බ්‍රිතාන්‍ය විරෝධී අරගලයෙන් උද්ගත වූ ප්‍රතිඵල කෙරෙහි අවධානය යොමු කරමින් එය ශ්‍රී ලංකා ඉතිහාසයේ තීරණාත්මක අවස්ථාවක් සලකුණු කරන අයුරු පරීක්ෂා කරන්න. (ලකුණු 09 යි)

**8.** 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරන්න. (ලකුණු 16 යි)

**9.** පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

(i) ශ්‍රී වික්‍රම රාජසිංහ

(ii) දහනවවන සියවසේ දෙවන භාගයේ ඇති වූ බෞද්ධ පුනර්ජීවනය

(iii) පොන්නම්බලම් රාමනාදන්

(iv) 1956 මහ මැතිවරණය

(එක් කෙටි සටහනකට ලකුණු **08** බැගිනි)

* * *

AL/2020/25/S-I(NEW)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

NEW


ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

| | | |
|---|---|---|
| ශ්‍රී ලංකා ඉතිහාසය I<br>இலங்கை வரலாறு I<br>History of Sri Lanka I | 25 | S |

ප්‍රශ්න අංකය / வினா இல. / Question No. 1

විභාග අංකය / சுட்டெண் / Index No. ..................................



PAST PAPERS WIKI

WWW.PastPapers.WIKI

Past Papers Wiki - Download More Past Papers and Study Well!